# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No } 10120

ෆැක්ස්
தொலைநகல } 011-
Fax

දුරකථන
தொலைபேசி
Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site } www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO } 1847/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No } / 2024

දිනය
திக
Date } 14/12/2024
පැය 1030

## මාධ්‍ය නිවේදනය

**විදුලි සැර වැදී මිය ගිය පුද්ගලයෙකුගේ මෘත ශරීරය සැඟවූ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ඌරගස්මංහන්දිය පොලිස් වසම.**

2024.12.09 වන දින ඌරගස්මංහන්දිය පොලිස් වසමේ වල්ඉඟුරුකැටිය ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකු කුරුඳු තැලීමට මාතරට යන බව පවසා නිවසින් පිටව ගොස් 2024.12.11 වන දින තෙක් නිවසට නොපැමිණීම සම්බන්ධයෙන් ඌරගස්මංහන්දිය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව එම පුද්ගයා මැන්ඩෝරාවල ප්‍රදේශයේ පිහිටි පැමිණිලිකරුගේ සහෝදරියගේ නිවසට ගොස් පාපැදිය එහි දමා අසල වෙල් යායකින් එගොඩ වී ගොස් ඇති බවට විමර්ශන නිලධාරින් විසින් අනාවරණය කරගෙන ඇත. එම පුද්ගලයාගේ මෘත ශරීරය එම ප්‍රදේශයේම පාලු ඉඩමක වැළිකිලි වළකට දමා ඇති බවට ලද තොරතුරක් මත 2024.12.13 වන දින ඇල්පිටිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් පසු මෘත ශරීරය ගොඩ ගැනීමට කටයුතු කර ඇත.

**මරණකරු වයස අවුරුදු 58 ක් වූ වල්ඉඟුරුකැටිය ,ඌරගස්මංහන්දිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තවදුරටත් කරන ලද විමර්ශන වලදී එම ප්‍රදේශයේ සතුන් දඩයම් කිරීම සඳහා අනවසර විදුලි රැහැන් අදින සැකකරුවන් දෙදෙනෙකු හඳුනාගෙන 2024.12.13 වන දින අත් අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීම් වල දී මොවුන් විසින් යොදන ලද අනවසර විදුලි රැහැනක පැටලී මරණකරු මිය ගොස් සිටි බවත්, එම මෘත ශරීරය පිළිබඳව කිසිවෙකුට නොදන්වා ඉහත පාළු ඉඩමේ වැසිකිලි වලට දැමීමට කටයුතු කර ඇති බව පොලිසිය අනාවරණය කර ගෙන ඇත .

**සැකකරුවන් අවුරුදු 35 හා 46 වයස්වල පසුවන ඌරුගස්මන්හන්දිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා ඇල්පිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරුවන් විසින් අනවසර විදුලි රැහැන් ඇදීමට යොදා ගන්නා

ලද කම්බි පොලිස් භාරයට ගෙන ඇති අතර උඩුරුගස්මන්හන්දිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**